කොවිඩ් 19 - සති පාසල - සබරගමු පළාත

9 ශ්‍රේණිය | ඉතිහාසය | (6 වන සතිය)

ඒකකය - 04 | ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය

- ක්‍රියාකාරකම් අංක 01 - ඉන්දියාවේ යුරෝපීය බලපෑම් හඳුනාගනිමු.

පැවරුම් අංක 01

හැදින්වීම:- දේශගවේශනයේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රි.ව.1498 දී පෘතුගීසි ජාතික වස්කෝ ද ගාමා ඇතුළු පිරිස ඉන්දියාවට පැමිණි අතර පසුව විවිධ කාල වකවානු තුළ පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි හා ප්‍රංශ යන යුරෝපීයන් ඉන්දියාවට පැමිණ එහි වෙරළබඩ ප්‍රදේශ වල බලය තහවුරු කොටගෙන ඇත. මෙය යුරෝපීය ජාතීන් අතරින් ඉන්දියාව තුළ ස්ථාවර දේශපාලන බලයක් ගොඩනගන ලද්දේ ඉංග්‍රීසින් විසිනි. ඉංග්‍රීසින් විසින් විවිධ උපක්‍රම භාවිත කරමින් ඉන්දියාවේම සිය බලය පැතිරවීමට පියවර ගත් අතර එම ඉංග්‍රීසි පාලනයට විරුද්ධව 19 වන හා 20 වන සියවස්තුර ඉන්දියාව තුර ඇතිවූ නිදහස් සටන් ව්‍යාපාරයන් පිළිබඳවත් මෙහිදී අධ්‍යයනකෙරේ.

- ගුණාත්මය යෙදවුම් :-9 ශ්‍රේණියේ ඉතිහාසය පෙළ පොත/ඉතිහාසය සටහන් පොත්

- ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්

පියවර 01:- ඉතිහාසය පෙළ පොතේ ඒකකය 4 ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය යන පාඩම ශබ්දනගා අවස්ථා 2 ක් කියවන්න.

පියවර 02:- @ ඔබගේ සටහන් පොත ගෙන පාඩමේ මාතෘකාව ලියන්න.
@ පසුව ඉහත දක්වා ඇති හැදින්වීම එම මාතෘකාවට යටින් සටහන් කර ගන්න.
@ පසුව පහතින් සපයා ඇති ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න.
(එහිදී ප්‍රශ්නය සටහන් කර ගැනීමෙන් පසු පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.)

ප්‍රශ්නාවලිය.

01) ඉන්දියාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතික දේශ ගවේශකයා කව්රුන්ද? ඔහු පැමිණි වර්ෂය ලියා දක්වන්න.
02) ඉන්දියාවට පැමිණ බලය තහවුරු කරගත් යුරෝපීය ජාතිකයින් හතර අනුපිළිවෙලින් ලියා දක්වන්න.
03) යුරෝපීය ජාතින්ගේ මුල්කාලීනව පෙරදිගට පැමිණීමට හේතුවූ අරමුණු දෙක දක්වන්න.
04) ඉන්දියාව පුරා බලය තහවුරු කර ගනිමින් ඉන්දියාව සිය යටත් විජිතයක් බවට පත්කරගත් යුරෝපීය ජාතිය කුමක්ද?
05) වස්කෝද ගාමා ඉන්දියාවට පැමිණෙන අවධියේ පැවති කුඩා රාජධානි 2ක් දක්වන්න.
06) 1509 දී පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත්ව ආ පුද්ගලයා කව්රුන්ද?
07) පෘතුගීසින්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය ලෙස තෝරාගත් ස්ථානය කුමක්ද?
08) පෙරදිගට පැමිණි ලන්දේසීන් මුලින්ම සිය අවධානය යොමුකළේ ආසියාවේ කුමන ප්‍රදේශයකටද?
09) ආසියාව තුළ ලන්දේසි බලය ව්‍යාප්ත කිරීමට පියවරගත් ලන්දේසි ජාතිකයා කවුරුන්ද?
10) ඉංග්‍රීසින්ගේ මව්රට කුමක්ද?
11) ඉංග්‍රීසි මුල් කාලයේ ආසියාවේ කුමන ප්‍රදේශ කෙරෙහි අවධානය යොමුකළේද?
12) ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණෙන විට එහි පැවති අධිරාජ්‍යය කුමක්ද?
13) එම අවධියේ එම අධිරාජ්‍යයේ පාලකයා කව්රුන්ද?
14) 1613 ඉංග්‍රීසින් වෙළඳ ගබඩාවක් පිහිටුවා ගත් ස්ථානය කුමක්ද?
15) 1613 පසුව ඉංග්‍රීසින් බලය පිහිටුවා ගත් ප්‍රදේශ 3 දක්වන්න?
16) බොම්බාය දායාද වශයෙන් ඉංග්‍රීසින්ට හිමිවීමට හේතුව ලියා දක්වන්න?
17) ප්‍රංශ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම පිහිටවූ වර්ෂය ලියා දක්වන්න?
18) 1668 ඉන්දියාවට පැමිණි ප්‍රංශවරු වෙළඳ ගබඩාවක් ඉදිකළ ස්ථානය කුමක්ද?
19) ප්‍රංශ වරුන්ගේ වෙළඳ ගබඩා පිහිටුවා තිබූ ස්ථාන 4 ක් ලියන්න?

පසුවැඩ:- 4 වන ඒකකය පදනම් කර ගනිමින් ප්‍රශ්න හතළිහකින් යුත් ප්‍රෙහෙලිකාවක් නිර්මානය කරන්න. එය තම ඉතිහාසය විෂයභාර ගුරුභවතාවෙත ලබා දෙන්න.

සැකසුම:- උදාර අරවින්ද.